# ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ
# බදු නිලධාරි II ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2025

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි-ඛණ්ඩ 2 සේවා ගණය යටතේ වන බදු නිලධාරි II ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 03 සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට සුදුසුකම්ලත් ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025.11.28** දින වේ.

## 01. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-

I. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන්, අයදුම්පත් කැඳවන අවසාන දිනට ඌව පළාත තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර, ඡන්ද හිමි නාම ලේඛනය මගින් හෝ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන නියමිත ආකෘතිය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු අතර, ඌව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35 නොවැඩි විය යුතුය.

V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීමට අදාළ අයදුම්කරු අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

## 02. අධ්‍යාපන සුදුසුකම් :-

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් උපාධියක් ලබා තිබීම,

හෝ

II. වරලත් ගණකාධිකරණ ආයතනයේ ව්‍යාපාර හා ගිණුම්කරණ සහතික පත්‍ර II අදියර සමත් වීම, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ ඩිප්ලෝමාව ලබා තිබීම,

හෝ

III. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වීම.

## 03. වැටුප් පරිමාණය :-

රා.ප.ච. 10/2025 හි MN-5-2025 අනුව රු. 58,660/- 10 x 1,190 - 11 x 1,360 - 15 x 1,670 - රු. 110,570/- ක් වූ වැටුප් පරිමාණයේ 1 වන පියවර වන රු. 58,660/- ක් වන අතර, උක්ත චක්‍රලේඛයේ උපලේඛන III අනුව 2027.01.01 දින දක්වා වැටුප් ගෙවනු ලැබේ.

## 04. බඳවා ගැනීමේ ක්‍රමය :-

විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන විවෘත ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

මෙම තරඟ විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. කිසිදු හේතුවක් මත විභාගයට ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කරනු නොලැබේ.

2 පිටුවට....

## I. ලිඛිත තරඟ විභාගයේ විෂයය නිර්දේශය :

මෙම විභාගය පහත පරිදි ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ.

| විෂයය | උපරිම ලකුණු ප්‍රමාණය | කාලය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| අවබෝධය | 100 | පැය 01 | 40% |
| බුද්ධි පරීක්ෂණය | 100 | පැය 01 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | පැය 01 | 40% |

- **විෂයය අංක 01 - අවබෝධය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමි වේ.

**I වැනි කොටස :**

රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ.

**II වැනි කොටස :**

භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුනු පාඨයන් කිහිපයකින් සමන්විත වේ. මෙම පාඨයන් ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදයන්ගේ අර්ථය තනි වාක්‍යකින් ප්‍රකාශ කරන ලෙස හෝ ඒ පිළිබඳ විවරණාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්පයන් කාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා පිළිතුරු කිහිපයක් අතුරින් නිවැරදි පිළිතුර තෝරා දක්වන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබේ.

- **විෂයය අංක 02 - බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණය, විග්‍රහ ශක්තිය හා නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව පිළිබඳ මැනීමක් කිරීම අරමුණු කොටගෙන සම්පාදනය කරනු ලබන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

- **විෂයය අංක 03 - සාමාන්‍ය දැනීම**

ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර්ජාතික වශයෙන් වැදගත්වන්නා වූ කාලීන තත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව දැනුම පිරික්සීම සඳහා සම්පාදනය කරනු ලබන්න ප්‍රශ්න පත්‍රයකි.

## II. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලබන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :- ඌව පළාත් බදු නිලධාරී තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම.

සටහන :- සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් විසින් ලබා ගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

3 පිටුවට....

## 05. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-

I. මෙම විභාගය සඳහා ඉදිරිපත් වන නිලධාරීන්, https://exams.psc.up.gov.lk/ වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගත අයදුම් කිරීමේ ප්‍රවේශය වෙත පිවිස **2025.11.28 දින හෝ ඊට පෙර** විභාගය සඳහා මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කළ යුතු අතර, එම අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට යොමු කළ (Submit) පසුව අයදුම්පතේ මෘදු පිටපත බාගත (මෙනුවෙහි Application වෙත පිවිසෙන්න) කර ගත යුතුය. බාගත කර ගන්නා ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන නියමිත විභාග ගාස්තු ගෙවා එම මුදල් ගෙවන ලද කුවිතාන්සිය ද නියමිත ස්ථානයේ අලවා, අදාල අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2025.12.05 දිනට පෙර "ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරී II ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2025"**යනුවෙන් සඳහන් කරන්න.

II. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

III. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ හෝ මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

## 06. විභාග හා පරිපාලන ගාස්තු :-

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු.1250/- කි. මෙම මුදල *ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත* මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත (මුල් පිටපත), එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක්, ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

## 07. විභාග ප්‍රවේශ පත්‍රය භාගත කර ගැනීම :-

විභාගය පැවැත්වීමට අවම වශයෙන් දෙසතියකට පෙර ප්‍රවේශ පත්‍ර ඊමේල් (Email) මගින් එවනු ලබන අතර, විභාගයට අයදුම් කිරීමේ දී විද්‍යුත් තැපැල් ලිපිනය (Email Address) නිවැරදිව සඳහන් කළ යුතුය. විභාග දිනට සතියකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක්, මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපතක් ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා වට්සැප් (WhatsApp) අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීමක් කළ යුතු වේ. මීට අමතරව https://exams.psc.up.gov.lk/admission/ සබැඳිය මගින් ද විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීමට පහසුකම් සලසනු ඇත.

## 08. අත්සන සහතික කිරීම :-

### I. පළාත් රාජ්‍ය සේවයේ / මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :-

අයදුම්පතෙහි ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවෙකු තම අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

4 පිටුවට....

**II. රාජ්‍ය සේවයේ නොසිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු/කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**09.** තරඟ විභාගය බදුල්ල හා මොණරාගල නගරවලදී පැවැත්වීමට අපේක්ෂා කෙරේ. අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාගය පැවැත්විය යුතු නගර පිළිබඳ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ඇත.

**10.** විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

**11.** නියමිත විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**12. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**13.** මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/තීරණය කිරීම් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

**14.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.** මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාව තුළ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දුරකථන අංක 055-2231460 ඇමතීමෙන් ලබා ගත හැකිය.

(එල්.ඒ.සෝමරත්න)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2025.11.10 වන දින.
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
බදුල්ල.